# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය


**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : **2556629** ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/135/20 ඔබේ අංකය :

2020.08.13

පාලන ලේකම්තුමා,
පොලිස් ඉතිරිකිරීමේ සංගමය,
අංක 01, දෙවන මහළ,
කුමාරන්රත්නම් පාර,
කොළඹ 02.

**<u>පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් හට ලැප්ටොප් පරිගණක සඳහා ණය ලබා ගැනීම සම්බන්ධව.</u>**

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය ශ්‍රී ලංකා පොලිසියේ පරික්ෂක ශ්‍රේණියේ නිලධරයන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කරන නිල සංගමයක් වන අතර, එහි සාමාජික සමාජිකාවන් 12000 කට අධික සංඛ්‍යාවක් සිටී, අප සංගමය මගින් සාමාජික සාමාජිකාවන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුලේ සාමාජික සාමාජිකාවන්ගේ සුභසාධන කටයුතු සම්බන්ධයෙන් නිතැතින්ම ක්‍රියා කරනු ලබයි.

පොලිස් නිලධරයන්ගේ මූල්‍යමය අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සෘජුවම සුභසාධනය සලසන ආයතනයක් වන පොලිස් ඉතිරිකිරීමේ සංගමය මගින් ලැප්ටොප් පරිගණක සඳහා ණයමුදලක් ලබා ගැනීමට කටයුතු කිරීම පිළිබඳව අප සංගමයේ විධායක කමිටුව විසින් සාකච්ඡා කරන ලදි.

දැනට සේවය කරන පරීක්ෂක ශ්‍රේණියේ තරුණ නිලධරයන් හට ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් භාවිතා කිරීමේ අවශ්‍යතාවය බොහෝ සේ ඇතිමුත්, එකවර මුදල් ගෙවා මිලදී ගැනීමේදී සිදුවන මූල්‍යමය ගැටළු හේතුවෙන් එම කටයුතු සිදු කර ගැනීමට නොහැකිවී ඇති බව නිරීක්ෂණය වී ඇත.

එබැවින් පොලිස් ඉතිරිකිරීමේ සංගමය මගින් වසර 03ක කාලයකින් ගෙවා නිමකිරීමේ පදනම මත 5% ක වාර්ෂික පොලී අනුපාතය යටතේ රු.120,000/- උපරිමයකට යටත්ව ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ණය මුදලක් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

**නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි**
**නීතිවේදී (ගෞරව)**
**ගරු ලේකම්,**
**ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය**

**අභිමානවත් පොලිසියක් ගොඩනගමු.**